# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.10 පැය 2245 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/702 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. විදුලිසැර වැදී පුද්ගලයෙකු මියයාම - කැඹිතිගොල්ලෑව පොලිස් වසම.**

2025.04.10 වන අද දින දහවල් කාලයේ කැඹිතිගොල්ලෑව පොලිස් වසමේ හල්මිල්ලවැටිය ප්‍රදේශයේදී පුද්ගලයෙකුට විදුලි සැර වැදී රෝහල්ගත කිරීමෙන් පසු මියගොස් ඇති බවට කැඹිතිගොල්ලෑව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වන හල්මිල්ලවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා ගොයම් කපන යන්ත්‍රයක් සේවා කිරීමට යාමේදී වතුර විදිනයේ ඇතිවූ විදුලි කාන්දුවක් හේතුවෙන් මෙලෙස විදුලිසැර වැදී ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

කැඹිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තෙරිපැහැ පොලිස් ස්ථානය.**

2025.04.10 වන අද දින දහවල් කාලයේ තෙරිපැහැ පොලිස් වසමේ තියඹරායාය ප්‍රදේශයේදී තෙරිපැහැ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන වැකුඹුර, තෙරිපැහැ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තෙරිපැහැ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - ඉඟිණියාගල පොලිස් වසම.**

2025.04.10 වන අද දින දහවල් කාලයේ ඉඟිණියාගල පොලිස් වසමේ ඉඟිණියාගල අම්පාර මාගර්යේ පොල්වත්ත ප්‍රදේශයේදී ඉඟිණියාගල දෙස සිට අම්පාර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් දකුණු පසට හැරවීමට යාමේදී පිටුපසින් එම දිශාවටම ධාවනය වූ යතුරුපැදියක් ත්‍රීරෝද රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු තුවාල ලබා ඉඟිණියාගල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ ඉඟිණියාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඉඟිණියාගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඉඟිණියාගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මිනුවන්ගොඩ පොලිස් වසම.

2025.04.10 වන අද දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ මිනුවන්ගොඩ කුරුණෑගල මාගර්යේ ගල්කන්ද හන්දිය ආසන්නයේදී දිවුලපිටිය දෙස සිට මිනුවන්ගොඩ දෙසට ධාවනය වූ ලොරි රථයක් බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකාරිය, ඇයගේ වයස අවුරුදු 05 ක් පමණ වන නිවුන් දැරුවන් දෙදෙනා හා නැන්දණිය බරපතල තුවාල ලබා මිනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී එක් පිරිමි දරුවෙකු මියගොස් ඇත. පැදිකාරිය වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලටත් පසුපැදිකාරිය හා අනෙක් පිරිමි දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා ගම්පහ රෝහලට මාරු කර යවා ඇත.

**මියගොස් ඇත්තේ වයස අවුරුදු 05 ක් වන වැගොව්ව, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෘත ශරීරය මිනුවන්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**